**ශීර්ෂය 055 - ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 25 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්විමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයේදී මෙම ශීර්ෂය සඳහා අමාත්‍යාංශයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවලට අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය. එසේම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් නොකරන ලදී.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ලැබීම් රු. 8,783,184 ක් වුවද, එය රු. 8,670,154 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් තැන්පතු ලැබීම් අගය රු. 113,030 කින් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් සමඟ කළයුතු ගැලපීම් සිදුකර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු. 8,783,184 ක් ලෙස පෙන්නුම් කරනුයේ මුදල් අමාත්‍යාංශයෙන් අදාළ මාරුපත්‍ර ඇතුළත් කිරීමේදී වූ දෝෂයක් හේතුවෙනි. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු. 5,996,796 ක් වුවද, එය රු. 8,319,728 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම නිසා අත්තිකාරම් ලැබීම් රු. 2,322,932 කින් වැඩියෙන් දැක්වුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශයේදී 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වන මුළු හර හා බැර අගයන් දක්වා ඇත. ඒ අනුව අදාළ ශේෂයන් නිසි පරිදි මුදල් අමාත්‍යාංශය 2019 දෙසැම්බර් 31 වන දින අදාළ හර බැර ගැලපීමෙන් පසු අවසන් ශේෂය රු. 21,500,329 ක් ලෙස අමාත්‍යාංශ පොත්වල සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හි සමානව තුලනය වී ඇත. |
| (ඇ) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගෙවීම් රු. 1,888,535 ක් වුවද, එය රු. 1,159,311 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් තැන්පතු ගෙවීම් රු. 729,224 කින් අඩුවෙන් දැක්වුණි. | භාණ්ඩාගාර පොත් සමඟ කළයුතු ගැලපීම් සිදුකර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හිදී එය රු. 1,159,311 ක් ලෙස පෙන්නුම් කරනුයේ මුදල් අමාත්‍යාංශයෙන් අදාළ මාරුපත්‍ර ඇතුළත් කිරීමේදී වූ දෝෂයක් හේතුවෙනි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු. 26,459,385 ක් වුවද, එය රු. 10,810,183 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා අත්තිකාරම් ගෙවීම් රු. 15,649,202 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | 2019 දෙසැම්බර් 31 දින අදාළ හර බැර ගැලපීමෙන් පසු අවසන් ශේෂය රු. 21,500,329 ක් ලෙස අමාත්‍යාංශ පොත්වල සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හි සමානව තුලනය වී ඇත. |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු. 149,286,164 ක් විය යුතු වුවද, එය රු. 130,697,837 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අක් මුදල් රු. 18,588,327 කින් අඩුවෙන් දැක්වුණි. | නිවැරදි අක්මුදල් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ හර බැර අගයන් සහ මෙම අමාත්‍යාංශයට අදාළ තැන්පතු ලැබීම් හා ගෙවීම් වටිනාකම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළෙමි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය අනුව මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් රු. 11,734,358 ක් දක්වා තිබුණද, මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වෙනුවෙන් දරා තිබූ වියදම රු. 3,465,801 ක් විය. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් රු. 8,268,557 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශනයේ අගයන් එකිනෙක ගැලපෙන පරිදි නිවැරදි අගය භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂය තුළ මිලදී ගැනීම් ලෙස ඇතුළත් රු.11,734,358 තුළ අමාත්‍යාංශයේ උප කාර්යාලයක් වන තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවේ වත්කම් මිලදී ගැනීම් රු. 8,169,079 ක් ද අන්තර්ගතව ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශය සතුව වාහන 35 ක් තිබූ අතර, එම වාහනවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබූ බැවින් දේපළ පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදි නොවුණි. | වාහනවල අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. | අමාත්‍යාංශය සතුව පවතින වාහනවල වටිනාකම තක්සේරු කර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අග්‍රිම ශේෂය ලෙස රු. 261,903 ක් දක්වා තිබුණද භාණ්ඩාගාර ගිණුම් අනුව එම අගය රු. 2,397,512 ක් වූයෙන් අග්‍රිම ශේෂය රු. 2,135,609 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට දී ඇති උපදෙස් ප්‍රකාරව භාණ්ඩාගාරයේ පොත් හා මූල්‍ය ප්‍රකාශනයේ ශේෂයන් ගැලපෙන ලෙස මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අග්‍රිම ශේෂය ලෙස රු.261,903 ක් දක්වා ඇත. භාණ්ඩාගාර ගිණුම් අනුව එම ශේෂය රු.2,397,512 කි. |

### 1.6.3 අක්මුදල් ගැලපුම් ගිණුම

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ----------------------------------- |
| (අ) | අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව අත්තිකාරම් ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් ශේෂයන් අතර වෙනසෙහි ශුද්ධ අගය රු. 20,403,945 ක් වුවද, අක් මුදල් ගැලපුම් ගිණුමට එය රු. 2,431,811 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් අක් මුදල් ගැලපීම් රු.17,972,134 කින් අඩුවෙන් දැක්විණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රථම භාණ්ඩාගාර පොත් සමඟ කළයුතු ගැලපීම් සිදුකර ලබා දී ඇති උපදෙස් අනුව නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ පොත් හා 2019 වර්ෂයට අදාළ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ මුළු හර හා බැර වටිනාකම් අතර වෙනසෙහි ශුද්ධ අගය අක්මුදල් ගැලපුම් ගිණුමට රු. 2,431,811 ක් ලෙස ගැලපුම් කර ඇත. |
| (ආ) | අමාත්‍යාංශ පොත් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව තැන්පතු ගිණුමෙහි ලැබීම් හා ගෙවීම් ශේෂයන් අතර වෙනසෙහි ශුද්ධ අගය රු. 843,253 ක් වුවද, අක් මුදල් ගැලපුම් ගිණුමට එය රු. 227,061 ක් ලෙස ගැලපීම් කිරීම හේතුවෙන් අක් මුදල් ගැලපීම් රු. 616,192 කින් අඩුවෙන් දැක්විණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රථම භාණ්ඩාගාර පොත් සමඟ කළයුතු ගැලපීම් සිදුකර ලබා දී ඇති උපදෙස් අනුව නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ පොත්වල සටහන් වටිනාකම් සහ අප අමාත්‍යාංශයට අදාළ තැන්පතු ලැබීම්, ගෙවීම් ශේෂයන් අතර වෙනස අක්මුදල් ගැලපුම් ගිණුම් රු. 227,061 ලෙස ගැලපුම් කර ඇත. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇප ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 89(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) හානි පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | අමාත්‍යාංශය විසින් මු.රෙ. 110 ප්‍රකාරව පවත්වාගෙන යායුතු ලේඛන 2019 වර්ෂය සඳහා යාවත්කාලීන කිරීම අතපසුවීමක් සිදුවූ බව පිළිගන්නා බව දන්වා සිටිමි. |
| (ඇ) රාජකාරි දුරකථන ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාරව රාජකාරි දුරකථන ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර 26 වැනි පරිශිෂ්ටයේ පරිදි රාජකාරි දුරකථන ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මු.රෙ. 845(1) ප්‍රකාරව සහ 26 වැනි පරිශිෂ්ටයේ නියම කර ඇති පරිදි දුරකථන ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2020 ජුනි 18 දින වනවිටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | භාණ්ඩ සමීක්ෂණය අඩුපාඩු බහුලව හා දෝෂ සහගත බැවින් ඒ සඳහා නව භාණ්ඩ සමීක්ෂණයක් 2020 ජුලි මස තුළදී සිදු කිරීම සඳහා කමිටු 5 ක් පත් කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ආදායම් ඉතා නිවැරදිව පුරෝකථනය කළයුතු වුවද ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 1,200 ක් හා රැස් කරන ලද ආදායම රු. මිලියන 615ක් වූයෙන් රැස්කරන ලද ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 51 ක් පමණක් විය. | ඇස්තමේන්තුවල ගැටළුවක් පවතී නම් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරවුල් කරගත යුතු අතර, ඇස්තමේන්තු පරිදි ආදායම රැස්කර ගැනීමට වගබලා ගත යුතු වීම. | භාණ්ඩාගාර ලේකම්ගේ 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ 03 වන ඡේදය ප්‍රකාරව ආදායම් පුරෝකතනය කළයුතු අතර විගණන විමසුමෙහි 2019 වර්ෂය සඳහා අමාත්‍යාංශ ඇස්තමේන්තුගත ආදායම රු. 1,200,000,000 ක් ලෙස දක්වා ඇත. එහෙත් 2019 වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ආදායම් ඇස්තමේන්තුව රු. 600,000,000 කි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පෞද්ගලික මාධ්‍ය ආයතන දෙකකින් අයවිය යුතු බදු ආදායම දඩ මුදල්ද සමඟ රු. 53,157,130 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් එම මුදල හිඟ හිටව තිබුණ ද, හිඟ ආදායම් ප්‍රකාශයේ එය සටහන් කර නොතිබුණි. | හිඟ බදු මුදල් හැකි ඉක්මනින් අයකර ගත යුතු අතර හිඟ බදු පිළිබඳව හිඟ ආදායම් ප්‍රකාශයේ සටහන් කළ යුතු වීම. | මෙම හිඟ මුදල අයකර ගැනීම සඳහා මාස 3 ක් ඇතුලත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙනු ඇත. |

**2.2** **වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයන් 25 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 100 ක් දක්වා ඉතිරිවීම් පැවති අතර, මේ සඳහා එම වැය විෂයයන්ට අයත් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම හෝ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, අරපිරිමැස්මෙන් වියදම් සිදු කිරීම , වියදම් සිදු නොවීම හා අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම ඉතිරි වීම් වලට හේතු වූ කරුණුය. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව 2020 මැයි 31 දින වනවිට වවුචර්පත් මඟින් ගෙවීම් කර තිබූ රු.232,436 ක් වූ බැරකම් 2019 දෙසැම්බර් 31 දිනට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වී නොතිබුණි. | මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇති සියලු බැරකම් හෙළිදරව් කළ යුතුය. | වවුචර්පත් අතපසු වීමකින් බැරකම් හා බැදීම් හි දක්වා නැති නමුත් සේවා අවශ්‍යතාවයන් මත ගෙවීම් කිරීමට සිදු වී ඇත. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව, කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත් අවස්ථා 83 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු. 1,804,012 ක අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 31 ක සිට දින 236 ක් දක්වා කාල පරාසයකින් පසුව පියවා තිබුණි. | රෙගුලාසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිසි අයුරින් නොපියවන නිලධාරීන්ට නැවත නැවත අත්තිකාරම් ලබා දීමට ඉදිරියේදී කටයුතු නොකරන බවද, මීට අදාළ අභ්‍යන්තර පාලනයන් නිසි අධීක්ෂණයක් යටතේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට ද බලාපොරොත්තු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ පරිපාලන අංශයද ඇතුළත්ව රු.මිලියන 3 ක ප්‍රතිපාදන සලසා තිබූ කාර්යභාරයන් 5 කින් කාර්යභාරයන් 4 ක් අපේක්ෂිත නිමැවුම් මට්ටම ළඟා කරගෙන නොතිබූ අතර ඉටු කළ ප්‍රමාණයද සියයට 5 ක තරම් අඩු මට්ටමක පැවතුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | නව ව්‍යාපෘති සඳහා 2019 අයවැයෙන් වෙන්වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් සැලසුම් කළ පරිදි අදාළ කාර්යයන් ඉටු කිරීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා වූ පනත 2019 වර්ෂයේ සම්මත කිරීමට සැලසුම් කර තිබූ නමුත් 2019 වර්ෂය අවසන් වන විටද එම ඉලක්කය ළඟා කර ගෙන නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු ඉටු කර ගත යුතු වීම. | මෙම පනත් කෙටුම් පතට 2020 මාර්තු 04 වන දින අමාත්‍ය මණ්ඩලය ලබාදුන් තීරණ පරිදි සකස් කරන ලද දළ කෙටුම්පත ක්ෂේත්‍රයේ පළපුරුදු අයගෙන් යුතු විද්වත් කමිටුවක් පත් කිරීමෙන් අනතුරුව මේ වනවිටත් සමාලෝචනය කිරීමේ කටයුතු එම කමිටුව විසින් ආරම්භ කරන ලදි. |

**3.2** **පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේ සිදු වී ඇති ලැප්ටොප් පරිගණක 02 ක් හා විදුලි පංකා 02 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට 2020 පෙබරවාරි 27 දින වනවිටත් කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ අස්ථානගත වූ විට මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ පරීක්ෂණ කටයුතු නොපමාව කළ යුතු වීම. | 2016 වර්ෂයේ සිදුවී ඇති ලැප්ටොප් පරිගණක 02 ක් හා විදුලි පංකා 02 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මු.රෙ.103 සිට 105 දක්වා සහ මු.රෙ.108 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන්ට උපදෙස් ලබා දීමටත් මෙම පරීක්ෂණයේ ප්‍රගතිය සම්බන්ධයෙන් ඔබව දැනුවත් කිරීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි. |

**3.3** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 13:2 අනුව මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා නියෝග කරන බලධරයෙකු විසින් ඒ ඒ සිදු වීමේ ස්වභාවය සැලකිල්ලට ගෙන අවස්ථාවෝචිතව මූලික විමර්ශනය කොතරම් කාලයක් ඇතුළත නිම කළ යුතු ද යන්න නියෝගය නිකුත් කරන අවස්ථාවේදීම නියම කළ යුතුය. නමුත් එසේ කටයුතු කර නොතිබීම හේතුවෙන් 2016 | රිය අනතුරු සම්බන්ධ මූලික පරීක්ෂණ ඉක්මනින් අවසන් කිරීමට වගබලා ගත යුතු වීම. | රථයේ හදිසි අනතුර සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ කටයුතු ප්‍රමාදවීම පිළිගන්නා අතර එවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| | ඔක්තෝබර් 01 වන දින අනතුරකට ලක්ව තිබූ වාහනයක් සම්බන්ධයෙන් වූ මූලික පරීක්ෂණ වාර්තාව අනතුර සිදු වී වසර 2 කට ආසන්න කාලයක් පමා වීමෙන් පසු ඉදිරිපත් කර තිබුණි. ඒ හේතුවෙන් වාහනය අලුත් වැඩියා කිරීමේ කටයුතු සඳහා වසර 2 ½ කට වැඩියෙන් ප්‍රමාද වී තිබුණි. | | |
| (ආ) | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා පවරා දී තිබිය දී 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්ව තිබුණි. එම කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා රැස්වූ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී අමාත්‍යාංශය විසින් රථයේ හානි හා පාඩු සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීමට යටත්ව අදාළ රථය රු.453,000 කට ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් අලුත්වැඩියා කර තිබූ නමුත් 2020 ජුනි 26 දින වන විටත් අනතුර සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා නොතිබුණි. | මූලික විමර්ශනයේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම නිරීක්ෂණය හා එකඟ වන අතර, 2016.12.26 දින සිදුවූ හදිසි අනතුර සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් සිදු කිරීම සඳහා 2018.06.13 දින සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති නමුත් මෙතෙක් එම පරීක්ෂණ වාර්තාව ලබාදී නොමැත. |
| (ඇ) | බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේ ඉදිකරමින් පවතින අමරදේව අසපුවේ ඉදිකිරීම් රු.මිලියන 250 ක ඇස්තමේන්තුවකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ සඳහා බලමුළු ගැන්වීමේ වැඩ පූර්ව අත්තිකාරම් (mobilization advance) රු. 31,390,535 ක් හා කරන ලද වැඩ සඳහා රු. 33,962,434 ක් 2019 වර්ෂයේදී අගෝස්තු වනවිට ගෙවා ඇති නමුත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 10ක් විය. තවද 2019 සැප්තැම්බර් වනවිට කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය අතහැර දමා තිබූ අතර ඒ වන විට නැවත අයකර ගැනීමට නොහැකිව ඇති අත්තිකාරම් මුදල රු. 20,951,883 ක් විය. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අදාළ මුදල් හැකි ඉක්මනින් අයකර ගත යුතු වීම. | උපදේශන ආයතනයේ ගණනය කිරීම් අනුව අත්තිකාරම් මුදලද ඇතුළත්ව අයවිය යුතු මුළු මුදල අමාත්‍යාංශය වෙත ගෙවන ලෙස මේ වන විට ඉදිකිරීම් ආයතනය වෙත දන්වා ඇති අතර, එම ගෙවීම් සිදු නොකරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව ද ලිඛිතව දන්වා ඇත. මෙම අසපුවෙහි ඉදිරි ඉදිකිරීම් කටයුතු නැවතත් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ තෝරා ගනු ලබන ඉදිකිරීම් ආයතනයක් වෙත පැවරිය යුතු බව සඳහන් වන බැවින්, මුදල් ප්‍රතිපාදන වෙන් වූ වහාම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිතය. |